**සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනය - 2016**

-----------------------------------------------------------------------

සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්ව විද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන
----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට සෞන්දර්ය අධ්‍යයනය පිළිබඳ ස්වාමි විපුලානන්ද ආයතනයේ (SVIAS) මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.
------------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු
----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට තථ්‍ය තොග ශේෂ වටිනාකම රු.1,377,111 ක් විය. කෙසේ වුවද, මෙම තොග ශේෂය රු.1,308,962 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ තොග ශේෂය රු.68,149 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) ආයතනයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුව පරිගණක මෘදුකාංග, අස්පෘශ්‍ය වත්කම් ලෙස සලකා තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගන්නා ලද රු.443,386 ක් වටිනා මෘදුකාංගයක් (LEARN) අස්පෘශ්‍ය වත්කම් යටතේ දක්වනු වෙනුවට පරිගණක උපාංග හා සවි කිරීම් යටතේ දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට කරන ලද මිලදී ගැනුම් ඇණවුම් සඳහා වායුසමීකරණ 8 ක් හා කුණුකූඩ (Dusbin) 90 ක් ලැබී තිබුණු අතර 2017 වර්ෂයේදී ඒ සඳහා රු.1,535,939 ක ගෙවීම් කර තිබුණි. කෙසේ වුවද, එම වායුසමීකරණ හා කුණුකූඩ සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් ගතකර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ජංගම නොවන වත්කම් එම මුදලින් වැඩියෙන් දක්වා තිබුණි.

#### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම
--------------------------------------

රු.3,256,855 ක් වටිනා පුස්තකාල පොත් හා වාර සඟරාවලට අදාළ සමීක්ෂණ මණ්ඩල වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2.2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | |
| (අ) මුදල් රෙගුලාසි 102 - 104 | ආයතනයට අයත් මෝටර් වාහන 3 ක් පෙර වර්ෂයේදී අනතුරුවලට භාජනය වී තිබූ අතර, ඒ සඳහා රු. 1,171,872 ක් වූ අලුත්වැඩියා කිරීමේ පිරිවැය 2015 වර්ෂයේදී ගෙවා තිබුණි. කෙසේ වුවද, ඒ පිළිබඳ ප්‍රමාණය තහවුරු කර ගැනීමට හා පාඩුවලට හේතු සහ වගකීම් නියම කිරීම සඳහා විමර්ශනයක් සිදු කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කටයුතු කර නොතිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි 880 | රාජ්‍ය නිලධාරීන්ගේ ඇප ආඥා පනත ප්‍රකාරව ආයතනයේ අධ්‍යක්ෂ, නියෝජ්‍ය ලේඛකාධිකාරී, ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරී, සහකාර මූල්‍යාධිකාරීගෙන් හා රියැදුරන් දෙදෙනෙකුගෙන් ඇප තැන්පතු ලබාගෙන නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.21,267,684 ක ශුද්ධ ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.2,915,242 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලවල රු.18,352,442 ක තවදුරටත් පිරිහීමක් දැක්වුණි. රු.13,844,515 කින් ක්ෂය හා ක්‍රමක්ෂය වියදම් වැඩිවීම මෙම පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය සඳහා ශුද්ධ ඌනතාවය රු.21,267,684 ක් වුවද, පුද්ගලික පඩිනඩි, රජයට ගෙවන ලද බදු හා සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය සැලකිල්ලට ගැනීමෙන් පසු ආයතනයේ අගය එකතු කිරීම රු.874,297,000 ක් විය. තවද පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ ආයතනය විසින් රට වෙනුවෙන් කරන ලද දායකය රු.1,255,000 කින් වැඩි වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

**විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේ ප්‍රමාදයන්**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2015 නොවැම්බර් 17 දිනැති අංක 15/2015 දරන ආයතන චක්‍රලේඛය අනුව, අභ්‍යන්තර සිසුන් සඳහා පවත්වන ලද විභාගවල ප්‍රතිඵල මාස 03 ක් ඇතුළත නිකුත් කළ යුතුය. කෙසේ වුවද, 2011/2012, 2012/2013, 2013/2014 හා 2014/2015 යන අධ්‍යයන වර්ෂ සඳහා පවත්වන ලද විභාගවල ප්‍රතිඵල කිසිඳු පිළිගත හැකි හේතුවක් නොමැතිව මාස 3 සිට මාස 7 දක්වා කාලයක ප්‍රමාදයක් සහිතව නිකුත් කර තිබුණි.

### 4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

**දිය සායම් පින්තාරු මේස හා මූර්ති චක්‍ර (Sculpture Wheels) මිලදී ගැනීම**

දෘශ්‍ය හා තාක්ෂණික කලා දෙපාර්තමේන්තුව විසින් කරන ලද ඉල්ලීමට අනුව, 2016 අගෝස්තු මාසයේදී රු.1,312,500 ක මුළු පිරිවැයකට මූර්ති චක්‍ර හා දියසායම් පින්තාරු මේස 50 ක් ආයතනය විසින් මිලදී ගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1 (අ) මාර්ගෝපදේශය ප්‍රකාරව, පිරිවිතරයන් ස්වභාවයෙන් වර්ගීය බවට තහවුරු කරගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව පිරිවිතරයන් සමාලෝචනය කිරීමට හා අනුමත කිරීමට වග කිව යුතු වේ. කෙසේ වුවද, ඉහත සඳහන් විෂයයන් තාක්ෂණික ඇගයීම් කමිටුවේ අනුමැතිය නොමැතිව ආයතනය විසින් ප්‍රසම්පාදනය කර තිබුණි.

(ආ) ගැනුම් ඇණවුම හා පිරිවිතරයන්ට අනුව, සැපයුම්කරුවකු විසින් ඉහත සඳහන් පින්තාරු මේස සඳහා තේක්ක දැව යොදා ගත යුතුය. කෙසේ වුවද, සැපයුම්කරු විසින් තේක්ක දැව වෙනුවට බාල වර්ගයේ දැව ඒ සඳහා යොදා ගෙන තිබුණි.

(ඇ) සපයන ලද විෂයය පිරිවිතරයන් සමඟ අනුකූල වී නොතිබුණු හෙයින්, තාක්ෂණික නිලධාරී විසින් 2016 අගෝස්තු 22 දින ගෙවීම ප්‍රතික්ෂේප කර තිබුණද, තාක්ෂණික නිලධාරියාගේ අප්‍රසාදය සැලකීමෙන් තොරව ගෙවීම සඳහා වගකියන නිලධාරියා විසින් 2016 අගෝස්තු 25 දින සැපයුම්කරුට ගෙවීම සිදු කර තිබුණි.

(ඈ) එම විෂයයන් පිරිවිතරයන් සමඟ අනුකූල නොවූ හෙයින්, සැපයුම්කරු විසින් සපයන ලද එම විෂයයන් භාර ගැනීම දෘශ්‍ය හා තාක්ෂණික කලා දෙපාර්තමේන්තුවේ සම්බන්ධීකාරක විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, සැපයුම්කරු විසින් සපයන ලද සියලු මේස ආයතන පරිශ්‍රයේ නිෂ්කාර්යව තබා තිබුණි.

(ඉ) තාක්ෂණික නිලධාරී විසින් ගෙවීම නිර්දේශ කිරීම ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව සැලකීමෙන් තොරව සැපයුම්කරුට ගෙවීම කිරීම සඳහා වග කියන නිලධාරියා විසින් ගෙවීම කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම ප්‍රසම්පාදනය සඳහා දරන ලද සම්පූර්ණ පිරිවැය ඵල රහිත වියදමක් බවට පත් වී තිබුණි.

## 4.3 කළමනාකරණ දුර්වලතා

-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 06 දෙනෙකුගේ එකතුව රු.752,515 ක් වූ ණය ශේෂ වර්ෂ 04 කට වැඩි කාලයක් හිඟ හිට පැවතුණි. කෙසේ වුවද, එම හිඟ ණය ශේෂ අය කරගැනීමට ආයතනය කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ විවිධ කාර්යයන් සඳහා අවස්ථා 94 කදී නිලධාරීන් 10 දෙනෙකුට ලබාදෙන ලද එකතුව රු.2,489,109 ක් වූ අත්තිකාරම් දින 14 සිට දින 106 ක් දක්වා ප්‍රමාදයකින් පසුව නිරවුල් කර තිබුණි.

## 4.4 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගබඩා භාරකරු තනතුර 2012 ජූලි 02 සිට පුරප්පාඩු වී පැවතුණි. කෙසේ වුවද, එම තනතුර සඳහා ස්ථිර නිලධාරියකු පත් කිරීමට කටයුතු නොකර නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ගබඩා භාරකරු විසින් වැඩ බැලීමේ පදනම මත එම තනතුරේ රාජකාරී සිදු කර තිබුණි.

(ආ) පරිවාස කථිකාචාර්ය තනතුර සහ ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණික නිලධාරී තනතුර 2013 ජනවාරි 01 දින සිට පුරප්පාඩු වී පැවතුණි. කෙසේ වුවද, මෙම තනතුරු පිරවීම සඳහා කටයුතු කර නොතිබුණි.

## 5. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

----------------------------------------

## 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය අනුව, සමාලෝචිත වර්ෂය සඳහා කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කර තිබුණේ දින 48 ක ප්‍රමාදයකින් පසුව 2017 අප්‍රේල් 18 දින දීය.

## 5.2 ක්‍රියාකාරී සැලැස්ම

-----------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 වගන්තිය ප්‍රකාරව යාවත්කාලීන කරන ලද ආයතනික ව්‍යුහය, අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව, අග්‍රිම අවශ්‍යතාවය, අභ්‍යන්තර විගණන සැලැස්ම, අරමුණු ඉටු කරගැනීම සඳහා කාර්යයන් ආදී තොරතුරු 2016 වර්ෂය සඳහා ආයතනය විසින් පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් කර නොතිබුණි.

## 5.3 වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයක් පිහිටුවීම

රැකියා විරහිතභාවය ශ්‍රී ලංකාවේ වර්තමානයේ පවතින ප්‍රධාන ගැටලුවකි. එබැවින් විශ්වවිද්‍යාල/ උසස් අධ්‍යාපන ආයතන විසින් දේශීය හා ගෝලීය රැකියා වෙළඳපොළ සඳහා අවශ්‍ය ඉතා දක්ෂ උපාධිධාරීන් බිහිකිරීම අවශ්‍ය වේ. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 2003 පෙබරවාරි 06 දිනැති හා 2010 ඔක්තෝබර් 21 දිනැති පිළිවෙලින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 819 හා 934 මගින් විශ්ව විද්‍යාල/ උසස් අධ්‍යාපන ආයතනවල වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයන් පිහිටුවීම හා මෙහෙයවීම සඳහා පැහැදිලි මාර්ගෝපදේශ ලබා දී තිබුණි. කෙසේ වුවද, ආයතනය විසින් වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයක් පිහිටුවීමට හා මෙහෙයවීමට 2017 ජුලි 19 දක්වා කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂකගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුවේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | අතිකාල කාර්යයන් පිළිබඳ පාලනය | අතිකාල කාර්යයන් පාලනය කිරීමට අසමත් වීම. |
| (ආ) | පුස්තකාල පරිපාලනය | භාණ්ඩ සමීක්ෂණ සිදුකිරීමට අසමත් වීම. |